# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1555 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 10/12/2023 පැය 2100

## මාධ්‍ය නිවේදනය

**මිහින්තලය රජමහා විහාරස්ථාන භූමියේදී සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කිරීම - මිහින්තලය පොලිස් ස්ථානය.**

2023.12.08 වන දින මිහින්තලය රජමහා විහාරය තුල රැඳී සිටි සැකකටයුතු පුද්ගලයකු එම විහාරස්ථානයේ ආරක්ෂාවට රාජකාරි යොදවා සිටි පොලිස් නිලධාරින් විසින් පරික්ෂා කිරීම සිදු කර ඇත. මෙහිදී එම පුද්ගලයා යුධ හමුදා සොල්දාදුවෙකු බවත් ඔහු මිහින්තලය රජ මහා විහාරයේ අළුත්වැඩියා කටයුතු වලට සම්බන්ධ වෙමින් කටයුතු කර ඇති බවත් මෙම සෙබලා නොවිච්යාගම පිහිටි යුධ හමුදා කඳවුරක් වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේනා මුලස්ථානයේ සෙබලෙකු  බවට අනාවරණය වී ඇත .

මේ පුද්ගලයා පොලිස් භාරයට ගෙන ප්‍රශ්න කිරිමේදී එහි විහාරාධිපති ස්වාමීන් වහන්සේද මේ සිදුවීම පිළිබඳව සොයා බලමින් මිහින්තලය පොලිස් ස්ථානාධිපතිවරයාට මෙය දැනුම් දී ඇත.

පොලිස් ස්ථානාධිපතිවරයා වහාම ක්‍රියාත්මක වී එම ස්ථානයට ගොස් මෙම යුධ හමුදා සොල්දාදුවා සම්බන්ධයෙන් සොයා බලා ඇති අතර ඒ අවස්ථාවේදී නොච්චියාගම යුධහමුදා කඳවුරේ මේජර් වරයකු සහ එම ප්‍රදේශයේ අණ දෙන නිලධාරියකු වු බ්‍රිග්‍රේඩියර්වරයකු එම ස්ථානයට පැමිණ, සොල්දාදුවා විහාරස්ථානයට සහ එහි පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා යොදවා ඇති බවට ප්‍රකාශ කර ඇත.

නිසි පරික්ෂා කිරීමෙන් හා ප්‍රශ්න කිරීමෙන් අනතුරුව එම සෙබළා ජොෂ්ඨ නිලධාරින් වෙත භාර දීමට ක්‍රියාකර ඇත. මොහු සම්බන්ධයෙන් වෙනත් විශේෂ කරුණු කිසිවක් අනාවරණය වී නොමැත .

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**